St.Sylvester's College OBA Australia Presents

**SSCKOBAA GET TOGETHER 2017**

Let's get together - old & new friends and enjoy some great food

SSCKOBAA would like to invite all s.s.c.k old boys
who live in Australia to the reunion party

**Saturday, 27th May 2017 at 7.00pm to Midnight**

Dress Code : Smart Casual
Walawwa – The Bungalow Reception Hall
477 Princes Hwy, Noble Park, Victoria 3174, Australia
Tickets $20 (SSCK Members only) Music & Food Provided BYO Drinks
RSVP by 13th of May 2017

Contact
Rajitha 0413433751 | Janaka 0433198096
All proceeds will be directed towards school projects by SSCKOBAA.

# "සිහින තුළ මුත් අමුතු රස ඇති" සිරිනාලි නවරත්න

පිට කවරය
**වර්නන් තිසේරා**

ප්‍රකාශණය
**කේ එස් පී පබ්ලිෂර්ස්**

## රවී සිරිවර්ධන

සිරිනාලි නවරත්න කිවිඳිය මවෙත එවා තිබූ "සිහින තුළ මුත් අමුතු රස ඇති" කාව්‍ය සංග්‍රහය කියවුවෙමි. ඇය කාව්‍ය පරිකල්පනයේ ගැඹුරට වඩා කාව්‍ය ආකෘතිය හා බසෙහි මතුපිට අලංකාරය පිළිබඳ වැඩි වෙහෙසක් දරා ඇති බව පෙනේ. එය බොහෝ නවක කවියන් අතරමං වන ඉසව්වකි....අප සසල කරනුයේ කාව්‍ය පරිකල්පනයේ අපූර්වත්වය විසින් මිස වෙනත් මතුපිට සැරසිලි විසින් නොවේ.

කවියා ජීවිතය හා ලෝකය වෙත හෙළන මුනිවර බැල්ම කවියේ සුවිශේෂත්වය වෙයි. අප නොසිතූ සසල කිරීමකට පත් කරන්නේ එම පරිකල්පනයේවිශේෂතාව විසිනි. එහෙත් බොහෝ නවක කවීන් කවියේ ආකෘතික සැරසිල්ලට ආකර්ශනය වී කාව්‍යමය ගැඹුර දියකර දමති.සිරිනාලිගේ කවිය තුළින් ද මා අත්විඳින්නේ එම දුබලතාව ම බව කිව යුතුය.... පරිකල්පනය සීමා කරන ආකෘති ඇගේ කවියට සරසක් වී තිබේ. ඇය ආකෘතියේ වහලෙක් වීමත් සමග කවිය දියවී යයි.අද්දැකීම් ප්‍රබල පරිකල්පනයක් ඇසුරෙහි මුදාහරින්නේ කෙසේ දැයි ඇය හැදෑරිය යුතුය... එය බොහෝ ඉවසීමෙන් කළ යුතු හැදෑරීමකි.... ඒ සඳහා රත්න ශ්‍රී විජේසිංහ, ආරියවංශ රණවීර, නන්දන වීරසිංහ වැනි ජ්‍යෙෂ්ඨ කවීන්ගේ




මෙන්ම රුවන් බන්ධුජීව, මහින්ද ප්‍රසාද් මස්ඉඹුල, ලක්ෂාන්ත අතුකෝරාල වැනි නව පරපුරේ ප්‍රවීණ කවීන්ගේ කවි මැනවින් අධ්‍යනය කරන්නේ නම් කාව්‍ය පරිකල්පනයේ විශේෂතා උගෙනීමට එය සැළකිය යුතු පිටිවහලක් වනු ඇත....

සිරිනාලිගේ කවීත්වය කැපී පෙනෙන " තාත්තා ගෙන්වන්න එපා ටීචර්" නමැති කවිය ඇගේ පරිකල්පනයේ විශේෂතාව නිසාම මසිත සසල කළ කවියකි.

තාත්තා පාසැලට කැන්දා
අහන්නට නම් එපා ටීචර්



ඔබේ සිත රිදවමින් හැමදින
පමා වී මම එන්න හේතුව

දිනක කුලියත් නැතිව යාවී
නේ ඔහු මුව ගොළුව යාවී
උගුර සිරවී කඳුළු ඇල්ලක්
දරු සනේ තෙමමින් හැලේවී

හතර දෙනෙකුගෙ කුසේ ගින්දර
දළු දමා සුසුමන් ගලාවී
ගෙදර බුදුනගෙ බෙහෙත්, කෑමත්
මේ නිසා යළි මග හැරේවී

පහේ ශිෂ්‍යත්වයට හිටියේ
කණිෂ්ටේ ලොකු සර් හින්දයි

පාස් වී මහ කොලීජියකට
හිතුවෙ නෑ මේ ලෙසට එන්නට

කලින් දා නිදි වරා කමතේ
විභාගය මම පාස් කෙරුවේ
හාමුගේ බේබිලට වැඩියෙන්
ලකුණු අරගෙන ඇතැයි කියුවේ

ගෙදර සිට ළඳු කැලෑ අස්සෙන්
තුනකි සැතපුම් තාර පාරට
මගදි ලංගම මිස්වුණා මිස්
කාසි නෑ වෙන එකක එන්නට

බොරලු පොළොවේ දණ ගසන්නම්
කෝටු වේවැල් පාර කන්නම්
තාත්තා පාසැලට කැන්දා
අහන්නට නම් එපා ටීචර්

පූර්වෝකත කවියේ විශේෂතාව මතු වන්නේ සිරිනාලිගේ පරිකල්පනය නිසාවෙනි.ඇය කෘතියේ බොහෝ කවිවල රකින්නට වෙර දරන ශ්‍රව්‍යරම්‍ය කාව්‍ය ආකෘතියක් මෙහි නැත.මෙහි ඇත්තේ අද්දැකීම විසින් ඉල්ලන බසකි,ආකෘතියකි.ඇය තවත් ඉවසිලිවන්ත වුයේ නම් මේ කවිය වුවද මීටත් වඩා ප්‍රබල ඉසව්වකට කැඳවාගෙන යන්නට තිබුණි....

එමෙන්ම කෘතියේ ගේය පද ආකෘත අනුව ලියූ කවි කිහිපයක් ද දැකගත හැකි විය.කවියත් ගීතයත් එකක් නොව මාධ්‍ය දෙකක් බව සිරිනාලී ගැඹුරින් තේරුම් ගත යුතුය....කෙසේ නමුත් ඉවසීමෙන් කවිය සමග එකගෙයි විසිය හැකි වෙතොත් ඇයට වඩා සාරවත් කවි අස්වැන්නට හිමිකාරියක් විය හැකි වෙතැයි මම කල්පනා කරමි.